## 2018 සැප්තැම්බර් මස පළවන ඉරුදින
## රට වෙනුවෙන් දෙවිඳුන් ඉදිරියේ
## මැදිහත් වීම

**"මාගේ නාමය දරණ මාගේ සෙනග බැගෑපත් වී, යාච්ඤා කර, මා සොයා තමුන්ගේ නපුරු මාර්ග අතහැරියොත්, මම ස්වර්ගයෙහි සිට එය අසා, ඔවුන්ගේ පව් කමා කොට, ඔවුන්ගේ දේශයට සෙත සලසන්නෙමි."**

(2 වංශාවලිය 7:14)

**හැඳින්වීම :**

වසර 2014 සැප්තැම්බර් පළවෙනි ඉරුදින පටන් වසරක් වසරක් පාසා පුබුදු ජනතාව අප දේශය වෙනුවෙන් දෙවියන් වහන්සේ ඉදිරියට පැමිණියෙමු. ඔවුන් වහන්සේ ද අපගේ යාච්ඤාවන්ට ද, මැදිහත් වීමට ද සවන් දෙමින් අප අතර ඉමහත් ප්‍රාතිහාර්යයන් කළ සේක. අප රටේ ව්‍යවස්ථාව තුළ ජනාධිපතිවරයාට තිබෙන අධික බලතල ඉවත් කරමින් ව්‍යවස්ථා සංශෝධනයක් ඉල්ලා යාච්ඤා කරන ලෙස අපව මෙහෙයවූයේ දෙවිඳුන්මය. එය එසේ සිදු විය. අධික වර්ෂාවත්, ජල ගැල්මත් හේතු කොටගෙන අප ජනතාව ගලවා ගන්නා මෙන් දෙවිඳුන්ට කනන්ලව් කරද්දී ඔවුන් වහන්සේ ද අප යාච්ඤාවට සවන් දෙමින් සියල්ලන් විශ්මයට පත් කරමින් වර්ෂාව නැවැත්වූ සේක. පිලිකා රෝගය ලොවින් තුරන් කරන ලෙස යාච්ඤා කරන මෙන් දෙවිඳුන් අපගෙන් කළ ඉල්ලීම අප කොතෙක් දුරට බරට ගත්තාද යන්න ප්‍රශ්නයකි. එහෙත් නූතන වාර්තා අනුව පිලිකා රෝගීන්ගේ සංඛ්‍යාව සැබවින්ම අඩුවෙමින් පවතී. අප අතර බොහෝ දෙනෙක් ප්‍රාතිහාර්යාත්මකව සුව වී සාක්ෂි දරා ඇත. ඒ සියල්ල මුල් කරගෙන අප ගැඹුරු ප්‍රශංසාවකට, නමස්කාරයකට ඇතුළත් වෙමු.

**දවසේ සුපුවත :**

2 වංශාවලිය 7:14 නැවතත් කියවන්න.

දෙවියන් වහන්සේගේ වචනය සැමදාම නැවුම්ය. අළුත්ය. දෙවියන් වහන්සේගේ වචනය ගින්නකි. දෙවියන් වහන්සේගේ වචනය තුළ දේව කැමැත්ත අපට හමු වේ. එය අපට හෙළිදරව් කරන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේය. දේව කැමැත්තට අප 'ආමෙන් ' කියන සෑම වාරයකදීම අපට දේවාශිර්වාදය ලබා ගත හැකිය. අද අප ඒකරාශි වී සිටින්නේ අප එකිනෙකාගේ පෞද්ගලික යැදුම් දෙවිඳුන් වෙත ඉදිරිපත් කිරීමට නොව, අප දේශය වෙනුවෙන් මැදිහත්වීමටය.
සැබෑ මැදිහත් කරුවාණෝ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේය.

මැදිහත්වීමේ යාච්ඤා ත්‍රිත්වික යාච්ඤාවකි. ක්‍රිස්තුන් වහන්සේ තුළින් ශුද්ධාත්ම බලයෙන් පියාණන් වහන්සේට කරන යැදුමකි. මැදිහත් වීමේදී කරනුයේ දෙවියන් වහන්සේගේ අනුග්‍රහය අන් අය වෙනුවෙන් ඉල්ලා යාච්ඤා කිරීමකි.
උදාඃ ජනතාවක් වෙනුවෙන්, රටක් වෙනුවෙන්, සභාව වෙනුවෙන් ආදි වශයෙනි.

කතෝලික සභාවේ ඉගැන්වීමට අනුව "මැදිහත්වීම යනු ක්‍රිස්තුන් වහන්සේ යාච්ඤා කළා වගේ යාච්ඤා කිරීමට යොමු වීමය. සකල ජනතාව වෙනුවෙන්, විශේෂයෙන් පව්කරුවන් වෙනුවෙන් පියාණන් වහන්සේ ඉදිරියේ පෙනී සිටින තැනැන් වහන්සේ ජේසුස් වහන්සේය." ( ccc 2634) පොළොව මත සිටියදී ක්‍රිස්තුන් වහන්සේ සෑම මිනිසෙක් වෙනුවෙන්ම මැදිහත් වූ සේක. මෙම දූත මෙහෙවර ජේසුස් වහන්සේ ආරම්භ කළේ පාළුකරයේ දින 40 තුළ යාච්ඤා කිරීමෙන්ය. ඔවුන් වහන්සේ නිරාහාරව සිටිමින් යාච්ඤා කළ සේක. (ශු.මතෙව් 4:2)

ශු.ලූක් 22:31-32 කියවන්න.

**"සීමොන්, සීමොන් මෙය අසන්න. තිරිඟු පොළන්නාක් මෙන් මම ඔබ සියලු දෙන පොළාලන්නට සාතන් අවසර ලබා ඇත."**

ජේසුස් වහන්සේ පේදුරු තුමාට අනතුරු අඟවමින් කුමක්ද කිව්වේ? මම සාතන්ගේ වැඩ නවත්වන්නම් යැයි පැවසුවේ නැත. එහෙත් පේදුරු තුමාගේ ඇදහිල්ල නොබිඳෙන පිණිස ඔහු උදෙසා යාච්ඤා කළ සේක. ජෙත්සෙමනි මල් උයනේ ඔවුන් වහන්සේ යාච්ඤා කළා පමණක් නොව, තම ශ්‍රාවකයන්ව ද එයට සම්බන්ධ කරවා ගැනීමට උත්සාහ ගත් සේක. ශු.ජුවාම් 17 පරිච්ඡේදය ගත් විට එකම යැදුමකි.
ඔවුන් වහන්සේ කුරුසියේ එල්ලී සිටිමින් අවසාන හුස්ම හෙළීමට පෙර තම සතුරන් උදෙසා යාච්ඤා කළ සේක. ඔවුන් උදෙසා පියාණන් වහන්සේ ඉදිරියේ මැදිහත් වූ සේක.

හෙබ්‍රෙව් වරුන්ට ලියන ලද ලිපිය අප භාවනා කරන විට ක්‍රිස්තුන් වහන්සේගේ මැදිහත්වීම පිළිබඳව ඉතාමත් පැහැදිලි විග්‍රහයක් දැකගත හැකිය.
හෙබ්‍රෙව් 5:7 කෙරෙහි අපගේ සිත යොමු කරමු.

**" ක්‍රිස්තුන් වහන්සේ මිනිසත් බව ගෙන සිටියදී තමන් මරණයෙන් ගළවන්නට පිළිවන්වූ තැනැන් වහන්සේට බලවත් හැඬීමෙනුත් කඳුළු සැලීමෙනුත්, යාච්ඤා ද කන්නලව්ද ඔප්පු කළ සේක. ඔවුන් වහන්සේගේ දේව ගරු බිය නිසා, දෙවියන් වහන්සේ එයට සවන් දුන් සේක."**

බොහෝ විට ජේසුස් වහන්සේගේ දූත සේවාව මෙනෙහි කිරීමේදී අපගේ සිත් යොමු කරනුයේ ඔවුන් වහන්සේගේ ඉගැන්වීමේ දූත කාර්යය, යකුන් දුරු කිරීම, සුව කිරීම, ප්‍රාතිහාර්යයන් යනාදිය කෙරෙහිය.
හෙබ්‍රෙව් 8:6

**"එහෙත් දැන් ඔවුන් වහන්සේ වඩා උතුම් පොරොන්දු පිට පිහිටුවන ලද වඩා විශිෂ්ට ගිවිසුමක මැදහත්කාරයාණන්ව සිටින සේම ඔවුන් වහන්සේ වඩා උතුම් සේවක ධුරයක් ලැබූ සේක."**

මනුෂ්‍ය පුත්‍රයා හා දේව පුත්‍රයා ලෙස ක්‍රිස්තුන් වහන්සේ දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා අතර, අතරමැදියෙකු සේ සිටින සේක. මෙම ස්වභාවයන් දෙකම දරණ තැනැන් වහන්සේ ලෙස මනුෂ්‍යයා වෙනුවෙන් මැදිහත් වීමට සුදුසුම තැනැන් වහන්සේ ඔවුන් වහන්සේමය. අසම සම මැදිහත් කරුවාණෝ ඔවුන් වහන්සේමය.

1තිමොති 2:5-6 කියවන්න.

**"ඇත්තේ එකම දෙවියන් වහන්සේය. දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයන් අතර වනුයේ එකම මැදහත්කාරයෙකි. එනම්, මනුෂ්‍යයෙකු වූ ක්‍රිස්තුන් වහන්සේය......"**

ක්‍රිස්තුන් වහන්සේගේ මැදිහත්කාරකමේ උච්ඡතම අවස්ථාව වනුයේ කුරුසියේ මරණයයි. අපව විශ්මිත කරන තවත් වැදගත්ම සුභාරංචියක් වනුයේ උත්ථානයෙන් පසුවද ඔවුන් වහන්සේගේ මැදිහත්වීම දිගින් දිගටම සිදු වීමය.

**"අප උදෙසා මැරුණාත්, අප අදෙසා මරණයෙන් උත්ථාන වූයෙත් ක්‍රිස්තුන් ජේසුස් වහන්සේය. දෙවියන් වහනසේගේ දකුණු පස වැඩසිටිමින් අප වෙනුවෙන් මැදිහත් වන්නේත් ඔවුන් වහන්සේය."** (රෝම 8:34)

මොන තරම් වැදගත් දේව වචනයක්ද? අදත් ක්‍රිස්තුන් වහන්සේ පියාණන් වහන්සේගේ දකුණු පස වැඩ සිටිමින් අප උදෙසා මැදිහත් වන සේක.

**"එබැවින් ඔවුන් වහන්සේ මගින් දෙවියන් වහන්සේ වෙතට ළඟා වන්නන් ගලවන්නට ඔවුන් වහන්සේට පිළිවන. මන්ද ඔවුන් උදෙසා මැදිහත් වීමට ඔවුන් වහන්සේ සදහටම ජීවත් වන බැවිනි."** (හෙබ්‍රෙව් 7:25)

මෙම දේව වචනය අපට අද දිනට විශාල සුභාරංචියකි. ආශිර්වාදයකි. ජේසුස් වහන්සේ අද දවසේදීත් පියාණන් වහන්සේගේ දකුණු පසයෙහි වැඩ සිටිමින් පව්කරුවන් උදෙසා මැදිහත් වීම අපව උසස් කරයි.

***********************

## මනස්ථාපන මෙහෙය

01. ආරම්භය - පුබුදු ගී අංක 231 "ශුද්ධාත්මයාණෙනි වඩින්න මා හදවත පුරා ....

02 යොමුව :

* 2 වංශාවලිය 7:14 කියවන්න.
  මාගේ නාමය දරණ මාගේ සෙනඟ බැගෑපත් වී, යාච්ඤා කර මා සොයා තමුන්ගේ නපුරු මාර්ග අතහැරියොත්.....
* බැගෑපත්වී යාච්ඤා කරන්න ....
* මා සොයා නපුරු මාර්ග අත හැරියොත් ....

(අ) **බැහැපත් වී**

කියවන්න ජෝනා 3:2-10

6 වන පදය

නිනීවයේ රජු | සිංහාසනයෙන් බැස<br>තම සළුව ඉවතලා<br>දළ රෙදි පොරවා ගෙන

10 වන පදය

* අප දේශයේ ජනතාව වෙනුවෙන් ඔබට / මට බැහැපත් වීමට, හිස්වීමට ඇරයුමක්
* නිනීවයේ රජතුමා සිංහාසනයෙන් බැස තම සළු ඉවතලූසේ .....
  අපගේ උගත්කම්, යාන වාහන, වත් පොහොසත්කම්, නිල තල, මතිමතාන්තර පසෙක දමා මනස්ථාපනයට ඇතුළු වීමට ඇරයුමක්.
* අපගේ අහංකාරකම, උඩඟුව, මමත්වය (මම/මට/මගේ/අපේ) එයින්ද හිස් වීමට
* පුබුදු ගී අංක 21 "හිස් වෙමු හිස් වෙමු...." ගායනා කරමු.

(ආ) **නපුරු මාර්ග**

* අපගේ පෞද්ගලික පාපය
  මුල් අගුණ පව්, ඇතුලාන්ත තුවාල, පුරුදු, ඇබ්බැහිවීම්
  මේ සියල්ලට වඩා භයානක අපගේ අධික පෙළඹීම වන ඝනයයි.
  එය භයානක පාපයක් වනුයේ අපි හැම කෙනාටම පෞද්ගලිකවම හරි දේ - වැරදි දේ, යහපත - අයහපත, විය යුතු දේ - නොවිය යුතු දේ, කළයුතු දේ - නොකළ යුතු දේ මේක තමයි කියන මිණුම් දණ්ඩ තල්ලුව යොමුව සපයන ඇතුලාන්ත බලවේගය පෙළඹීම එය වන බැවිනි.
- එය වඩාත් භයානක වන්නේ අප තුළ තිබෙන මෙම පෙළඹීම වැරදි යන හැඟීම අප තුළ නැති නිසාය. "මට හැඟෙන්නේ මේක හරි, මේක තමයි විය යුතු දේ මේක කළොත් හරි කියාය."
- අපි ශුද්ධාත්ම මෙහෙයවීම ගැන කොච්චර කථා කලත්, හොඳට අවදි වී හඳුනා නොගතහොත් පුබුදුවේ, සංඝයේ, සමාජයේ රටේ ප්‍රශ්න වලදී පවා මාව මෙහෙයවන්නේ මගේ අධික පෙළඹීමයි, ඝනයයි.
- අපි අද ඊට අවදි වී මනස්ථාපනය වෙමු.
- දේව වචනයට, දේව කැමැත්තට, දේව රාජ්‍යයට ඉඩ දීමට එය බාධාවකි. එය පාපයකි.

* අපේ තව භයානක නපුරු මාර්ගයක් නම් සමාජය තුළ රජ කරන මතවාද වලට අප නොදැනුවත්වම හසුවීමයි.
- අපගේ රට තුළ එදා මෙදාතුර අප ඇන කොටාගත්තේ විවිධ මතවාදයන් රජකරවන්නටය.
  1. ධනවාදය
  2. සමාජ වාදය
  3. ලිබරල් වාදය

* ලිබරල් වාදය :

ලිබරල් වාදයේ මූලික අදහස නිදහසයි. ලිබරල් වාදයේ වැදගත් වන්නේ පුද්ගලයා වේ. කේන්ද්‍රය පුද්ගලයාගේ නිදහසයි. පුද්ගලයාගේ නිදහසට බාධා වන සියළු බැඳීම්වලින් පුද්ගලයා නිදහස් කළ යුතුය. සාරධර්ම, ආචාර ධර්ම, සංස්කෘතිය ආගමික හර පද්ධතිය ජන සමාජයේ පොදු වටිනාකම් පුද්ගලයාගේ නිදහසට බාධා නොකළ යුතුය.

- මේ විවිධ මතවාදයන් මත පදනම් වී කොළ පාට වේවා, නිල් පාට වේවා, රතු පාට වේවා, කහ පාට වේවා, කුනු ලේ පාට වේවා පක්ෂ දේශපාලනය රටක් , ශ්‍රී ලාංකීය ජාතියක් හැටියට අපව අද රැගෙනවිත් තිබෙන තත්ත්වය අපට පැහැදිලිය.

- ක්‍රිස්තුන් වහන්සේගේ දැක්ම තුළ එක මතවාදයක්වත් නැහැ. ක්‍රිස්තුන් වහන්සේගේ දැක්ම වූයේ සමාජය පාගා දමන පව්කාරයා, දිළින්දා එසවීමය. මේ ක්‍රිස්තු දැක්ම අපගේ පදනම නිසයි එක වසරක (1989) ශුද්ධාත්ම රැළියේ තේමාව වූ "දිළිඳුන්ගේ සහාව වෙමු අපි" යනුවෙන් අපි අවදි වූයේ.

- අද වන විට අපි එකිනෙකා අපගේ දැක්මෙන් පදනමින් බැහැර වෙමින් එක් එක් මතවාද වලට අසුවී සිටිමු ද?

- ඒවායින් හැරෙන්න අද අපි තීරණයක් ගනිමු.

- කිතුනු පිබිදුනු අපගේ දේශපාලන පදනම විය යුත්තේ පක්ෂ, පාට, මත වාද නොව ක්‍රිස්තුන් වහන්සේගේ දැක්මය. දේව රාජ්‍යය නමැති දර්ශනය ය. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ තුළ මුළු විශ්වය ඒකරාශී කිරීමය.

- සියළු ජාතීන්ට, ආගමිකන්ට පැහැදිලි වන භාෂාවෙන් "ධර්මය" යැයි කිව හැකිය. සෑම ආගමකම මූලික හරය වන ධර්මය මත ජන සමාජය පදනම් විය යුතු බවයි. අපගේ දැක්ම ක්‍රිස්තුන් වහන්සේගේ දැක්ම. ක්‍රිස්තුන් වහන්සේ එය වචනගත කළේ දේව රාජ්‍යය කියාය.

බෙදා ගැනීම :

01. ඔබ පෞද්ගලිකව යම් මත වාදයකට නොදැනුවත්වම හසු වී නැද්ද? අවංකවම බෙදා ගන්න.
02. පිබිදුනු කිතුනුවෙකු ලෙස සාමාන්‍ය කිතුනුවන්ට වඩා පාපය පිළිබඳ අවබෝධය ගැඹුරු විය යුතුය. පාපයේ විවිධ ස්වරූප පැතිකඩ ගැන අවදිවීමක් තිබිය යුතුයි. ඔබ ගැන බෙදා ගන්න.

03. මනස්ථාපනයේ යාච්ඤාව :

පුබුදු ගී අංක 227 "හැරෙනා පිණිස....."
ශු.මාක් 1:14-15

- දේව රාජ්‍යය වෙත මනස්ථාපනයක්
- දේශපාලනික දැක්ම මතවාද මත නම් ඒ තත්ත්වයෙන් පවිත්‍ර වීමක් පතා මනස්ථාපනයෙන් යුතුව යාච්ඤා කරමු.
- අද වන විට පැතිරී යන ජාතිවාදය, ආගම් වාදයෙන් අපව ගලවා ගන්නා ලෙසද මොර ගසමු.
- අපි බෙදා ගත් අපගේ පාපය පිළිබඳ මනස්ථාපනය වී යාච්ඤා කරමු.
- කුරුස පාමුලට ගමන් කරමින් සමූලික පරිණාමනයක් පතා යාච්ඤා කරමු.

පුබුදු ගී අංක 192 "ඔසවමි ඔබ වෙත...."

**********************

## මැදිහත්වීමේ යාච්ඤා මෙහෙය

**2 වංශාවලිය 7:14**

> **"මාගේ නාමය දරණ මාගේ සෙනඟ බැගෑපත් වී, යාච්ඤා කර, මා සොයා තමුන්ගේ නපුරු මාර්ග අතහැරියොත්, මම ස්වර්ගයෙහි සිට එය අසා, ඔවුන්ගේ පව් කමා කොට, ඔවුන්ගේ දේශයට සෙත සලසන්නෙමි."**

අදට නියමිත දේව වචනය "2 වංශාවලිය 7:14" භාවනා කිරීමේදී නව ගිවිසුම තුළ පමණක් නොව, පුරාණ ගිවිසුමේ සිටම තමන්ගේ දේශය වෙනුවෙන් මැවුම්කාර දෙවිඳුන් ඉදිරියේ පෙනී සිටීම දෙවියන් වහන්සේගේ කැමැත්ත බව අපට පෙනෙනු ඇත. නපුරා ඉතාම සියුම්ව රටක පාලකයන් තුළ, ආයතනයන්හි පාලකයන් තුළ සහ විවිද ක්ෂේත්‍රවල නායකත්වයක් ගන්නා අය තුළ ක්‍රියා කරනු පෙනේ.

**1ජුවාම් 5:19** මෙසේ සඳහන් කරයි.

> **"අප දෙවියන් වහන්සේට අයිති බවත්, මුළු ලෝකය නපුරාට යටත් බවත් දනිමු."**

**එපීස 6:12** මෙසේ සඳහන් කරයි.

> **"මන්ද, අපගේ සටන මිනිස් සතුරන්ට විරුද්ධව නොව, අධිපතිකම් වලටත්, පරාක්‍රමධාරීන්ටත්, මේ අන්ධකාරයේ ලෝක මුලාදෑනීන්ටත්, ස්වර්ගීය ස්ථානවල සිටින සකල දුෂ්ට බලවේලගයන්ට ද විරුද්ධවය."**

දේව ජනතාව මේ ස්ථාවල සිටින අය වෙනුවෙන් දෙවිඳුන් ඉදිරියේ මැදිහත් නොවන්නේ නම්, අන්ධාරයේ බලවේගයනට ඔවුන් තුළ ක්‍රියා කිරීම ඉතාම පහසු වනු ඇත. අපගේ දේශය දෙස බලද්දී පාලකයන් විසින් කරනු ලබන දූෂිත ක්‍රියා දිනෙන් දින වැඩි වේගෙන යන ආකාරය දැකගත හැකිය. මෙවැනි ක්‍රියා සෑම රාජ්‍යයක් තුළම දකිනු ලබන පොදු ලක්ෂණ බවට පත් වී ඇත. බොරුව, වංචාව, දූෂණය, පගාව, ස්ත්‍රී දූෂණය, ළමා අපචාරය, මිනීමැරීම් යනාදි වශයෙනි. දිළින්ඳා පාගා දැමීම දෙවිඳුන් නොඉවසන පාපයන්ය. පාසල් දරුවන්ට වන අපචාරයන්, විශ්ව විද්‍යාල තුළ තිබෙන ප්‍රශ්න අනන්තය, අප්‍රමාණය. දෙවිඳුන් ලබා දුන් අලංකාරම රට ආරක්ෂා කර නොගැනීම දෙවියන් වහන්සේ නොඉවසන්නකි. රටක යහපත් පාලකයන් නොමැති තැන නිතැතින්ම ජනතාව දුක් විඳිනු ඇත.

එම නිසා අද දින යාච්ඤාව තුළ මැදිහත්වීමේ විශේෂතම කරුණක් වුනයේ වසර 2021 පවත්වන්නට යෙදෙන ජනාධිපතිවරණයයි. මෙතෙක් පැවති සෑම රජයකම යම් යම් යහපත දුටුවද, සමස්තයක් වශයෙන් ගත් කල විෂමතා රාශියක් රජ කෙරුණි. වර්තමානය දෙස බැලුවද දිළින්ඳා, අසරණයා පීඩා විඳින සැටි, වංචාව හා දූෂණය රජකම් කරන සැටිත් අපි දුටිමු. ඉතාම කෙටියෙන් ගත් කල ධර්මානුකූලව පවත්වා ගෙන ගිය පාලන ක්‍රමයක් මෑත ඉතිහාසයේ අප දැක නැත. මේ සියළු තත්ත්වයන් වෙනුවෙන් අපි දෙවිඳුන් ඉදිරියේ මැදිහත් වීමට සූදානම් වෙමු.

### 01. වර්ෂ 2021 පවත්වන්නට යෙදෙන්නාවූ ජනාධිපතිවරණය වෙනුවෙන් අපි යාච්ඤා කරමු.

* ධර්මයන් පදනම් වූ රාජ්‍යයන් ඉල්ලමින් අපි දෙවිඳුන් යදිමු. බුද්ධ ධර්මයේ හරය, හින්දු දහමේ හරය, ඉස්ලාම් දහමේ හරය සහ අප සමිඳාණන් වහන්සේගේ සුවිශේෂිතවූ දැක්මට අනුකූලවූ රාජ්‍ය පාලකයන් අපට දෙන මෙන් අපි යාච්ඤා කරමු.

### 02. මත්ද්‍රව්‍ය උවදුරෙන් අප පාසල් යන දරුවන්, තරුණ - තරුණියන් සහ දිළින්ඳා ඇතුළු මුළු දේශයම ගලවා ගනු පිණිස අපි යාච්ඤා කරමු.

* අප පාර්ලිමේන්තුව තුළ මෙයට විරුද්ධව කොපමණ කෑගසන හඬ ඇසුනත්, එය රට වැසියාට පෙනෙනුයේ, රට වැසියා රවටන දෝංකාර හඬක් සේ පමණය. ඉතාම කුඩා දරුවන් පවා මත්ද්‍රව්‍ය භාවිතයට හුරු වී ඇත. විශාල පරිමාණයෙන් විදේශයෙන් මත්ද්‍රව්‍ය අප රටට ගලා ගෙන එන ආකාරය පෙනේ. මෙයට විරුද්ධව කෑ ගසන බොහෝ දෙනාද ඉතා කූට ලෙස එම ව්‍යාපාරයට සම්බන්ධ බව පෙනේ. අප දෙවිඳුන්ගේ බලවත් හස්තය පාමින් අප දේශය ගළවා ගන්නා ලෙස අපි යාච්ඤා කරමු.

## 03. අපගේ පොදු නිවහන වන සොබා දහම සුරැකීමට අප රට පාලකයන් ද, සමස්ත ජනතාව ද යොමු වීම සඳහා අපි යාච්ඤා කරමු.

* පුබුදු ජනතාක් ලෙස අප දයාබර ශුද්ධෝත්තම ෆ්‍රැන්සිස් පාප් වහන්සේ විසින් නිකුත් කරන ලද විශ්ව චක්‍රලේඛණය අප භාවනා කර ඇත්තෙමු. අප ජීවත් වන, අපව ඔසවා ගෙන ඉන්න ලක් පොළොව, අපට එදිනෙදා භෝජනය සපයන ලක් පොළොව දෙස බලා අප ලක් මෑණි කියා ආමන්ත්‍රණය කරමු. ඒ හරභා ගලා බසින්නාවූ අලංකාර ගංගා ඉදිරියෙහි, කඳු නිම්න, හෙල් වැටි, වනාන්තර, සතා සිවුපාවුන්, කුරුල්ලන්, විවිධ පලතුරු වර්ග, විවිධ මල් වර්ග ඉදිරියෙහි විශ්මිතව බලා සිටිමින් අපි දෙවිඳුන් අගයනවා වෙනුවට මිනිසා ඒ සියල්ල විනාශ කරන්නට ආරම්භ කර ඇත. වනාන්තර විනාශ කිරීම, වටිනා ගස් වර්ග කපා මුදල් ඉපයීම, අලි ඇතුන් පවා මරා දැමීම, මුවන් පවා මරා ආහාරයට ගැනීම දිනපතා දකින්නට ලැබෙන සුලභ පාපයන්ය. ඒ සියල්ලටම වඩා සොබා දහමේ උතුම්ම මැවිල්ල වන මිනිසා, මිනිසා විසින්ම විනාශ කර දැමීම ඛේදවාචකයකි. වැඩිහිටියන්, කුඩා දරුවන් අපචාරයට ලක් කොට මරා දමති. ස්ත්‍රිය ගෞරවයේ ලකුණක් වෙනුවට දූෂණය කරනු ලබයි. ඒ සියල්ල මැවුම්කරුවාණන් නොඉවසන පාපයන්ය. මෙවැනි දෙයට පෙළඹෙන රාජ්‍ය පාලකයන්, ප්‍රාදේශීය සභා පාලකයන් ඇතුළු අන් කවුරුන් හෝ වේවා ඒ අය වෙනුවෙන් අපි දෙවිඳුන් ඉදිරියෙහි මැදිහත් වෙමු.

## 04. දිළිඳුන් නගා සිටුවන පාලන ක්‍රමයක් ඉල්ලා අපි යාච්ඤා කරමු.

* ක්‍රිස්තුන් වහන්සේගේ දැක්ම අප භාවනා කරද්දී එතැන අපට පෙනෙනුයේ "වාදය" නොවේ. ප්‍රජාතන්ත්‍රවාදය, සමාජ වාදය, මාක්ස් වාදය, ලිබරල් වාදය මේ කිසිවක් තුළ ක්‍රිස්තුන් වහන්සේ ලොවට පෙන්වූ රාජ්‍ය දැක්ම අපට පූර්ණව දැකගත නොහැකිය.
"අහෝ දෙවිඳුනි, ඔබ වහන්සේගේ පුතණුවන් අපට පෙන්වා දුන් ඔබ වහන්සේගේ රාජ්‍යයේ පාලනයෙන් බිඳක්වත් අප දේශයට ලබා දෙන මෙන් අපි ඉතාමත් උවමනාවෙන් ඔබ වහන්සේ ඉදිරියෙහි මැදිහත් වෙමු."

## 05. පිලිකා රෝගය ලොවින් තුරන් කිරීම සඳහා අපි යාච්ඤා කරමු.

* දෙවිඳුන්ගෙන් ලැබුනාවූ මේ වචනය පුබුදු ජනතාවක් ලෙස අප සැබවින්ම බරට ගත යුතුය. දැනටමත් අප අතර බොහෝ පිලිකා රෝගීන්, ඔවුන්ව සම්පූර්ණයෙන්ම සුවවී තිබෙන බව වෛද්‍යවරුන්ගේද සහතිකය ඇතිව ස්ථිර කර ඇත. පිලිකා රෝගය ලොවින් තුරන් විය හැක්කේ කෙසේද යන්න කෙනෙකුට සැකයක් උපදින්නට පුළුවන. අප එසේ සැක කලොත් අප සැක කරන්නේ දෙවියන් වහන්සේගේ බලයයි. දෙවියන් වහන්සේට සියල්ල කළ හැකිය. එම නිසා දෙවියන් වහන්සේගේ ආදරය සහ බලය කෙරෙහි ස්ථිර විශ්වාසයක් ඇතිව අපි යාච්ඤා කරමු.

********************